ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025-01-09

පැමිණිලිකාර පාර්ශවය : එෆ්.එච්.ජේ. රවුෆ් මිය,
නො. 35, ඉස්නාපුල්ල පටුමග,
දර්ගා නගරය.

වගඋත්තරකාර පාර්ශවය 01 ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බේරුවල.

02 ග්‍රාම නිලධාරී,
766 බී,
අලකඳුපිටිය.

<u>පැමිණිලි අංකය : එච්ආර්සී/50/24</u>

වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 09 දින දිය.

**පැමිණිල්ල**

පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් කරමින් සදහන් කර සිටින්නේ ඇයගේ උපත් වර්ෂය වන 1968 සිට ඇගේ පවුලේ සාමාජිකයින් සමග අංක 35, ඉස්නාපුල්ල ලේන්, දර්ගා නගරය යන ලිපිනයේ පදිංචිව සිටි බවත් 2010 වර්ෂය දක්වාම ජන්ද හිමි නාම ලේඛනයේද එම වසම තුලින්ම ඇයගේ නම ලියාපදිංචිව තිබූ බවත් ඇය වෘත්තියෙන් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක බැවින් 2011 වර්ෂයේ දී අංක 307, පළමුවන පටුමග, යූ.ඊ. පෙරේරා මාවත, රාජගිරිය යන ලිපිනයට ඇගේ පදිංචිය වෙනස් කර ගත්තා ලද බවත් සදහන්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කර ඇත. ඒ අනුව 2011 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඉහත කී රාජගිරිය ලිපිනයේ පදිංචිව සිටි අතර, ඡන්ද හිමි නාම ලේඛනයේ ද ඇයගේ නම ලියාපදිංචිව තිබුණු බවට සදහන් කර ඇත. පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් සදහන් කර ඇත්තේ, ඉහත සදහන් අංක 35,

ඉස්තාපුල්ල ලේන්, දර්ගා නගරය යන ලිපිනයේ සාදා ඇති නිවස සතු අයිතිය ඇයගේ මව වන මොහොමඩ් මව්ජුර් නූර් සෆා යන අය විසින් ප්‍රසිද්ධ නොතාරිස් අබ්දුල් මජීද් මොහමඩ් හම්සා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 2995 සහ 2015.12.18 දිනැති තෑගි ඔප්පුව මත ඇයට පවරා දී ඇති බවත්, එම නිවසේ 2011 සිට 2023 දක්වා ඇය නොසිටින නමුත්, ඇයගේ මව සහ සහෝදරයින් එම නිවසේ සිටි බවත්ය.

2022 වර්ෂයේ දී අගෝස්තු මස 14 දින ඉන්දුජීව සෙනෙවිරත්න යන අය තවත් කණ්ඩායමක් සමග ඇගේ ඉඩමට අනීතික ලෙස ඇතුලත්වීමෙන් පසුව මතුවූ ආරවුල් තත්වය හේතුවෙන් කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ 66 නඩුවක් ගොනු කිරීම හේතුවෙන් ඇය විසින් එම අවස්ථාවේ දී පදිංචිව සිටි 517 ඒ, වැලිකඩ බටහිර ග්‍රාම නිලධාරි වසමෙන් ඇයගේ පදිංචිය ඉවත් කරගෙන ඇගේ පෙර පදිංචි ග්‍රාම නිලධාරි වෙත ඉහත 517 ඒ, වැලිකඩ බටහිර ග්‍රාම නිලධාරි විසින් සිදු කරන පදිංචිය ඉවත් කර ගැනීමේ ලිපිය ඉදිරිපත් කර ඇයට පදිංචි සහතිකයක් ලබා ගන්නා ලද නමුත්, ඉන් පසුව එම ග්‍රාම නිලධාරියා විසින් බේරුවල ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කර ඇත්තේ පැමිණිලිකාරිය විසින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර පදිංචි සහතිකයක් ලබා ගෙන ඇති බවයි. ඒ අනුව වෘත්තීය වශයෙන් මහාචාර්යවරියක ලෙස වර්තමානයේ දී අග්නිදිග විශ්වවිද්‍යාලයේ දී ඇය රැකියාව කරන බැවින් ඇයගේ නිවසේ සෑම දිනකම පදිංචිව සිටීමට හැකියාවක් නොමැති බවත්, ඇය තාවකාලිකව ඇයට ලබා දී ඇති විශ්වවිද්‍යාල නිල නිවසේ සිටින බවත්, ශ්‍රී ලංකා පුරවැසියෙකු වශයෙන් ඇයට අයත් ග්‍රාම නිලධාරි වසමෙන් පදිංචියක් ලබා ගැනීමට අයිතියක් තිබෙන බවත්, එකී අයිතිය ලබා නොදීමෙන් ඇගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්, ඒ අනුව ඇයට එම ග්‍රාම නිලධාරි වසමේ පදිංචිය සහතික කර ගැනීමට අවශ්‍ය බවටත් ඒ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා සහනයක් ලබා දෙන ලෙසත් ඉල්ලා ඇත.

### වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම

### ග්‍රාම නිලධාරි යූ.ඒ. රත්මලී නිලන්තයනි මියගේ කරුණු දැක්වීම

යූ.ඒ. රත්මලී නිලන්තයනි හිටපු ග්‍රාම නිලධාරි, 766 බී, අලකදුපිටිය යන අය විසින් සදහන් කර ඇත්තේ ඇය 2015.02.17 දින සිට ඉහත කී වසමේ ග්‍රාම නිලධාරිණියක ලෙස සේවය කළ බවත්, ඇගේ සේවා කාලය තුළ පැමිණිලිකාරියට සාමාන්‍ය පදිංචිය මෙන්ම ඡන්ද හිමි නාම ලේඛනයට ද පැමිණිලිකාරියගේ නම ලියාපදිංචි වී නොතිබූ බවත්, 2023.03.23 පැමිණිලිකාරියගේ සහෝදරයෙකු විසින් පැමිණිලිකාරියගේ පෙර පදිංචි ස්ථානයෙන් ලබා ගන්නා ලද පදිංචිය හැරයාමේ ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැමිණිලිකාරියගේ තනතුරට ද ගරු කරමින් අදාළ නිවසේ ගෘහ මූලිකද පැමිණිලිකාරිය එහි පදිංචි බවට පිළිගැනීමෙන් පසුව පැමිණිලිකාරිය වෙත පදිංචි සහතිකයක් නිකුත් කළ බවයි. පසුව පැමිණිලිකාරිය විසින් අධිකරණයට ඉදිරිපත් කිරීමට නීතිඥ මහතා ඉල්ලූ බව පවසා ලිපියක් ඉල්ලූ අවස්ථාවේදී ඇය පිළිබඳව වැඩිදුරටත් සොයා බැලීමේදී ඇය ස්වාමිපුරුෂයා සහ දරුවන් සමග රාජගිරියේ යූ.ඒ. පෙරේරා මාවත, 307 දරණ නිවසේ පදිංචිව සිටින බවටත් ලියාපදිංචිය පමණක් දර්ගා නගරය ලිපිනයට රැගෙන විත් බවටත් දැනගැනීමට ලැබුණු බවයි. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලද ගෘහ ලේඛනයට මෙම පැමිණිලිකරුගේ නම ඇතුලත් වී නොමැති බවත්, ජන හා නිවාස සංගණනයේදී ද එම ලිපිනයට ඇතුලත් වී නොමැති බවත් එම සංගණනය අවස්ථාවේ දී නිවසට ගොස් විමසා සිටීමේදී පැමිණිලිකාරියගේ සහෝදරයාගේ භාර්යාව විසින් ප්‍රකාශ කරන ලද්දේ ඔවුන් පමණක් එම නිවසේ සිටින බවත්, පැමිණිලිකාරිය කොළඹ පදිංචි බවටත් දැනුම් දුන් බවයි. මෙසේ දැනගැනීමෙන් පසුව අසත්‍ය තොරතුරු ලබාදීම මත ඇය විසින් පැමිණිලිකාරියට නිකුත් කරන

ලද පදිංචි සහතිකය අවලංගු කිරීම සඳහා පැමිණිලිකාරිය සහ ඇයගේ සහෝදරයා වෙත දුරකථනය මගින් දැනුම් දී ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බේරුවල වෙත 2023.06.12 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධව දැනුම් දුන් බවත් ප්‍රකාශ කර ඇත.

**ප්‍රාදේශීය ලේකම් වන එල්.යූ. ජානක පෙරේරා මහතාගේ කරුණු දැක්වීම**

" පදිංචිය " ලෙස සලකනු ලබන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති HAF-03 MISCL – 04 – 001 චක්‍රලේඛයේ සඳහන් පරිදි තීරණය කරනු ලබන බවත් එහි සඳහන් පරිදි එය සාමාන්‍යයෙන් සනාථ කරගනු ලබන්නේ අවටින් විමසා බැලීමෙන් බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී විසින් නිකුත් කර ඇති 2023.06.01 දිනැති පදිංචි සහතිකය නිසි පරිදි සොයා බැලීමකින් තොරව නිකුත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවද, 2023.06.12 දිනැතිව ග්‍රාම නිලධාරී විසින් ඔහු වෙත එවා ඇති ලිපිය නිසි පරිදි කරුණු සොයා බලා වාර්තා කළ ලිපියක් බැවින් එකී ලිපිය නිවැරදි ලිපියක් බවට ඔහු පිළිගන්නා ලද බවත්, ඉහත ග්‍රාම නිලධාරීගේ ක්‍රියාකලාපය පිළිබඳව පදිංචි සහතිකයක් ලබාදීමට පෙර නිවැරදි ලෙස සාමාන්‍ය පදිංචිය සනාථ කර කටයුතු කරන ලෙසට ඇයට උපදෙස් ලබා දුන් බවත් පසුව ඇයව එම ග්‍රාම නිලධාරී වසමෙන් ඉවත් කිරීමට කටයුතු කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. තවද එකී ලිපිය මගින් මානව හිමිකම් කඩවීමක් නිරීක්ෂණය නොවන බවත්, සාමාන්‍ය පදිංචිය ලබා දිය හැක්කේ පදිංචිය සනාථ වීමෙන් පසුව බවත් ආගම හෝ ජාතිය අනුව හිමිකමක් උල්ලංඝණය වී නොමැති බවටත් හැඟී යන බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

2024.07.18 දින පැවති විමර්ශනයේ දී වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ ඉහත කී ග්‍රාම නිලධාරී වසමේ මෙම පැමිණිලිකාරියගේ නම ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර තිබෙන නමුත් භෞතිකව පදිංචියක් නොමැති බැවින් පැමිණිලිකාරිය වෙත පදිංචි සහතිකයක් නිකුත් කිරීමට නොහැකි බවයි. තවද, පැමිණිලිකාරිය වර්තමානයේ පදිංචිව සිටින ප්‍රදේශයට අදාළ ග්‍රාම නිලධාරී වසමේ ඇයට අවශ්‍ය කරන පදිංචි සහතිකයක් ලබා ගැනීමට හැකි බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරු විසින් සිය ස්ථාවරය තහවුරු කිරීම සඳහා මෙම කොමිෂන් සභාව වෙත පහත ලේඛනයන් ඉදිරිපත් කර ඇත.

01 රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2011.06.05 දිනැති අංක HAF-03 MISCL – 04 – 001 දරණ ලිපිය.

02 මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක NE 1/65/08 හා 2022.02.14 දිනැති චක්‍රලේඛය

වගඋත්තරකාර ආයතනය විසින් ගොනු කර ඇති 2024.08.26 දිනැති වාර්තාවේ සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකාරිය පදිංචිව සිටි ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 514/ඒ වැලිකඩ බටහිර ග්‍රාම නිලධාරී විසින් ඇය පදිංචිය හැර ගිය බවට වාර්තා කර ඇති ලිපියක් 766 ඒ අලකඳුපිටිය වසමේ ග්‍රාම නිලධාරී වෙත ලැබී ඇති නමුත්, 766 ඒ අලකඳුපිටිය ග්‍රාම නිලධාරිණිය වන යූ.ඒ. රත්මලී නිලනයනී මිය විසින් සත්‍ය වශයෙන්ම පරීක්ෂා කර බලා තහවුරු කරගත් කරුණු අනුව මෙම පැමිණිලිකාරිය අංක 35, ඉස්නාපුල්ල පටුමග, දර්ගානගරය යන ලිපිනයේ සාමාන්‍ය පදිංචියක් නොමැති බවට වාර්තා කර ඇති බවයි.

තවද, මෙම පැමිණිලිකාරිය ඉදිරි දිනකදී මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉහත කී වසමේ සාමාන්‍ය පදිංචිය සඳහා පැමිණියහොත් එතැන් සිට පදිංචිය පිළිබඳ තහවුරුවක් ලබාදීමේ හැකියාවක් පවතින බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණය**

පැමිණිලිකාරිය ඇගේ උපන් දා සිට 2010 වර්ෂය දක්වා අංක 35, ඉස්තාපුල්ලලේන්, දර්ගා නගරය යන ලිපිනයේ පදිංචිව සිට ඇති බවත්, 2011 වර්ෂයේ දී ඇගේ පදිංචිය අංක 307, පළමුවන පටුමග, යූ.ඊ. පෙරේරා මාවත, රාජගිරිය යන ලිපිනයට වෙනස් කරගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

ඇය වෘත්තීය වශයෙන් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක බවත්, වර්තමානයේ දී ඇය අග්නිදිග විශ්වවිද්‍යාලයේ සේවය කරන බවටත්, ඇගේ වෘත්තියේ ස්වභාවය අනුව ඇගේ නිවසේ රැදී සිටින කාලයට වඩා විශ්වවිද්‍යාලයේ හා ඇයගේ නිල නිවසේ සිටින කාලය වැඩි බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය විසින් ඉහත සදහන් ලිපිනයේ පිහිටි නිවස, ඇයට ඇයගේ මව විසින් තෑගි ඔප්පුවක් මගින් පවරා ඇති බවයි. ඇය 2011 වර්ෂයේ සිට 2023 පෙබරවාරි මස දක්වා අංක 307, පළමුවන පටුමග, යූ.ඊ. පෙරේරා මාවත, රාජගිරිය ලිපිනයේ පදිංචිව සිට ඇති බවට නිරීක්ෂණය වේ.

ඉන් පසුව 2023.03.13 දින සිට එම ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසමෙන් ඇගේ පදිංචිය ඉවත් කර ගෙන ඇති බවට ආර්.එච්.එම්. බුද්ධිකා දර්ශනී, ග්‍රාම නිලධාරී, 514/ඒ, වැලිකඩ බටහිර (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ) යන අයගේ ලිපිය මගින් තහවුරු වන බවට නිරීක්ෂණය වේ.

ඉහත කී පදිංචිය හැර යාමේ ලිපිය, 2023.03.23 දින අංක 766 ඒ, අලකදුපිටිය ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, පැමිණිලිකාරිය වෙත 2023.06.01 දින පදිංචි සහතිකයක් නිකුත් කර ඇති අතර, පසුව එම පදිංචි සහතිකය දීමට පැමිණිලිකාරිය එම ස්ථානයේ පදිංචියක් නොමැති බවට දැනගැනීමෙන් පසුව සහ 2023.06.01 දින පැමිණිලිකාරිය වෙත අදාළ ග්‍රාම නිලධාරී විසින් පදිංචි සහතිකයක් නිකුත් කර ඇත්තේ, නිසි පරිදි සොයා බැලීමකින් තොරව බවට අනාවරණය වීමෙන් පසුව එකී පදිංචිය අවලංගු කර ඇති අතර අදාළ ග්‍රාම නිලධාරී අවවාද කර එකී වසමෙන් ඇය ඉවත් කිරීමට ද ප්‍රාදේශීය ලේකම් බේරුවල විසින් කටයුතු කර ඇති බවටත් නිරීක්ෂණය වේ. තවද 2023.06.01 දින වනවිට පැමිණිලිකාරියගේ නම එම වසම තුළ ඡන්ද හිමි නාම ලේඛනයට ද ඇතුළත් වී නොතිබුණු බවට 2024.06.13 දින පරීක්ෂණයේ දී එවකට සිටි ග්‍රාම නිලධාරී විසින් ප්‍රකාශ කර ඇත. කෙසේ නමුත් 2024.07.18 දින වන විට පැමිණිලිකාරියගේ නම ඡන්ද හිමි නාම ලේඛනයට ඇතුළත් කර ඇති බවට 2024.07.18 දින පරීක්ෂණයේ දී වගඋත්තරකරු විසින් පිළිගෙන ඇත.

ඉහත කී අංක 766 ඒ, අලකදුපිටිය ග්‍රාම නිලධාරී වසමේ මෙම පැමිණිලිකාරියගේ නම මේ වන විට ඡන්ද හිමි නාම ලේඛනයට ඇතුළත් වී තිබුණද භෞතික පදිංචියක් නොමැතිව පදිංචි සහතිකයක් ලබා දීමට හැකියාවක් නොපවතින බවටත්, ඒ සදහා ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ මෙම පැමිණිල්ලේ උද්ගත වී ඇති ගැටළුවට අදාළ නොවන බවට නිරීක්ෂණය වේ.

තවද, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කර ඇති 2011.06.05 දිනැති ලිපියේ සහ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක HAF-3-MISCL-04-001-11 සහ 2019.01.26 දිනැති ලිපියේ සදහන් කරුණු අනුව එහි අයිතම 4 හි සදහන් වන්නේ ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත්ව නොමැති අයෙකුට පදිංචි සහතික නිකුත් කිරීමේදී එවැනි තැනැත්තන් නිසි සොයා බැලීමක් සිදු කරන ලෙසයි. නමුත් මෙම පැමිණිලිකාරියගේ නම 766 ඒ අලකදුපිටිය ග්‍රාම නිලධාරී වසමේ ඡන්ද හිමි නාම ලේඛනයට ඇතුළත් වී ඇති බවට වගඋත්තරකරු විසින් පිළිගෙන ඇති බැවින්, ඊට අමතරව සොයා බැලීමක් සිදු කිරීමක් අවශ්‍ය නොවන බවට නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකාරිය විසින් පෙර පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් සිදු කරන ලද පදිංචිය හැර යාමේ ලිපිය ද, මෙම ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කිරීම තුළින් ද ඇය පෙර පදිංචි ස්ථානයෙන් පිටව ඇති බවට සහ වෙනත් වසමක පදිංචිය සඳහා ඉල්ලුම් කර නොමැති බවට නිරීක්ෂණය වේ.

තවද, ඇය වෘත්තීය වශයෙන් කථිකාචාර්යවරියක් වන අතර මේ වනවිට ද අග්නිදිග විශ්වවිද්‍යාලයේ සේවය කරමින් සිටින බැවින් ඇයට ඇගේ නිවසේ භෞතිකව රැඳී සිටීමට තිබෙන කාලය ද ඉතා අඩු කාලයක් නමුත් ඇය එකී වසම තුළ ඇගේ පදිංචිය අත්හැර නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකාරියගේ නම ඉහත කී අංක 766 ඒ, අලකදූපිටිය ග්‍රාම නිලධාරී වසමේ ඡන්ද හිමි නාම ලේඛනයේ ඇතුළත් වී තිබියදී, ඇයට පදිංචි සහතිකයක් ලබාදීමට වගඋත්තරකරු ඇයගේ භෞතික පදිංචිය සම්බන්ධව සලකා බලමින් එකී සහතිකය නිකුත් කිරීමට ප්‍රතික්ෂේප කර ඇති බවට නිරීක්ෂණය වේ.

**නිගමනය**

ඉහත සඳහන් නිරීක්ෂණ අනුව උක්ත පැමිණිලිකාරියගේ නම 766 ඒ, අලකදූපිටිය ග්‍රාම නිලධාරී වසමේ 2023 වර්ෂය සඳහා ඇතුළත් කිරීමේදී ඇගේ භෞතික පදිංචිය පිළිබඳව තිබූ ගැටලුවක් හේතුවෙන් එම වසමේ ලියාපදිංචි නොකරන ලද නමුත් 2024 ජූලි මාසය වනවිට ඡන්ද හිමි නාම ලේඛනයට ඇගේ නම ඇතුළත් වී ඇති බැවින්, ඇය වෘත්තීය වශයෙන් අග්නිදිග විශ්වවිද්‍යාලයේ කතිකාචාර්යවරියක් ලෙස සේවය කිරීම හේතුවෙන් එහිදී ඇය විශ්වවිද්‍යාල නිල නිවසේ පදිංචිව සිටින්නේ තාවකාලිකව බවට ප්‍රකාශ කර ඇති බැවින් ඉහත සඳහන් අංක 766 ඒ, අලකදූපිටිය ග්‍රාම නිලධාරී වසමේ පදිංචිය අත්හැර නොමැති බවට අනාවරණය වන බැවින් සහ ඉහත සඳහන් ග්‍රාම නිලධාරී වසම තුළට මෙම පැමිණිලිකාරියගේ නම ඇතුළත් කිරීමට හිමිකමක් ඇති බවට පෙනී යයි.

**නිර්දේශය**

1. උක්ත පැමිණිලිකාරියගේ නම මේ වන විට ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් වී ඇති බැවින්ද, වෙනත් ග්‍රාම නිලධාරී වසමක ලියාපදිංචි වී නොමැති බැවින්ද අංක 766 ඒ, අලකදූපිටිය ග්‍රාම නිලධාරී වසමේ පදිංචි බවට පදිංචි සහතිකය නිකුත් කිරීමට අදාළ පියවර ගන්නා ලෙස නිර්දේශ කරනු ලැබේ.

2. 2023.06.01 දින පැමිණිලිකාරිය වෙත නිසි පරිදි සොයාබැලීමකින් තොරව පදිංචි සහතිකයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකරු වන ප්‍රාදේශීය ලේකම් බේරුවල විසින් දෙවන වගඋත්තරකරු වන ග්‍රාමනිලධාරී සම්බන්ධව සුදුසු විනය පියවර ගෙන එකී වසමෙන් ඉවත් කිරීමට පියවර ගෙන ඇති බැවින් ඒ සම්බන්ධව නිර්දේශ නිකුත් කිරීමට කටයුතු කරනු නොලැබේ.

2025. 02. 11 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1966 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන්

සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : විෂය භාර අමාත්‍යතුමා, රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය (ස්වදේශ කටයුතු අංශය)

නිල මැදුර,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05